දෙවන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.
இரண்டாவது மாடி, செத்சிறிபாய,
பத்தரமுல்லை, இலங்கை.
2nd Floor, Sethsiripaya, Battaramulla,
Sri Lanka.

ප්‍රසන්න රණතුංග
பிரசன்ன ரணதுங்க
PRASANNA RANATUNGA

ආණ්ඩුපක්ෂ ප්‍රධාන සංවිධායක
அரச தரப்பு பிரதம கொறடா
CHIEF GOVERNMENT WHIP
පාර්ලිමේන්තු මන්ත්‍රී
பாராளுமன்ற உறுப்பினர்
MEMBER OF PARLIAMENT

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சர்
Minister of Urban Development & Housing

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2022-10-24

## විශේෂ නිවේදනය

මා දේශපාලන තීන්දුවක් ගැනීමට සූදානම් වන බවටත් ඒ සම්බන්ධයෙන් මාගේ මිනුවන්ගොඩ දේශපාලන මණ්ඩලයේ සාමාජිකයන් මා විදේශ ගතව සිටින අතරතුර රහසිගතව ඡන්දයක් පවත්වා ඇති බවටත් පසුගිය සති අන්තයේ පුවත්පත් වල හා වෙබ් අඩවි කිහිපයක පළවූ වාර්තාව පිළිබඳව මාගේ විශේෂ අවධානය යොමු විය.

මෙම රහස් ඡන්දය පැවැත්වූණේ පසුගිය 20 වෙනිදාය. ඒ පෞද්ගලික සංචාරයක් සඳහා මා විදේශගතව සිටියදීය. 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ඡන්ද විමසීම පැවැත්වෙන අවස්ථාවේදී විදේශ ගත වීම සම්බන්ධයෙන්ද ඇතැමුන් මට චෝදනා කර තිබෙනු දක්නට ලැබුණි.

22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ විවාදය හා ඡන්ද විමසීම පාර්ලිමේන්තුවේදී පැවැත්වීමට නියමිතව තිබුණේ ඔක්තෝම්බර් 06 සහ 07 දෙදින තුළයි. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී කළ විශේෂ ප්‍රකාශය පිළිබඳ විවාදය එම දින දෙක තුළ ගැනීමට පක්ෂ නායකයන් තීරණය කළ නිසා ඔක්තෝම්බර් 20 සහ 21 දෙදින තුළ 22 වන ව්‍යවස්ථා සංශෝධන විවාදය හා ඡන්ද විමසීම පැවැත්වීමට තීරණය කෙරුණි. මාගේ විදේශ ගතවීම සිදුවූයේ මෙම තීරණයට කලින් යොදා ගත් සැලසුමකට අනුවය. 06 සහ 07 දෙදින තුළ අදාල විවාදය හා ඡන්ද විමසීම පැවැත්වූයේ නම් ඒ සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීමට මම සූදානමින් සිටියෙමි. පක්ෂ නායක රැස්වීමේදී ගත් තීන්දුවක් අනුව මෙම විවාදය හා ඡන්ද විමසීම කල් දැමූවත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස ජනාධිපතිවරයාත්, අගමැතිවරයාත් සභානායකවරයාත් දැනුම්වත් කොට ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන සංවිධායකවරයා වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රධාන ලේකම්වරයාට අදාල වගකීම පැවැරිමි. එය සාමාන්‍යයෙන් මෙවැනි තත්ත්වයකදී අනුගමනය කරන ක්‍රියා පිළිවෙතයි. මාගේ විදේශ ගතවීම සිදු වූයේ

කාර්යාලය / அலுவலகம் / Office: +94(0)11 2866444, +94(0)11 2867163
ෆැක්ස් / தொலைநகல் / Fax: +94(0)11 2861588, +94(0)11 2861770
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: prasanna.ranatunga@hotmail.com

ජනාධිපතිවරයාගේද අවසරය ඇතිව බැවින් 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන විවාදයේදී හිතාමතාම විදේශ ගත වූ බවට මා වෙත එල්ල කරනු ලබන චෝදනා ප්‍රතික්ෂේප කරමි.

පසුගිය 20 වැනිදා මිනුවන්ගොඩ දේශපාලන මණ්ඩලයේදී වර්තමාන දේශපාලන තත්ත්වය තුළ මා ගතයුතු ඉදිරි පියවර පිළිබඳ මෙම ඡන්ද විමසීම සිදු කෙරුණේ මගේ අනුදැනුම ඇතිවය. රට වෙනුවෙන් දේශපාලන තීන්දුවක් ගත යුතු සෑම අවස්ථාවකදීම හෘදය සාක්ෂිය ඇති දේශපාලනඥයෙකු ලෙස මම මාගේ ආසනයේ දේශපාලන මණ්ඩලය අදහස් විමසීම මවිසින් සිදු කරන අතර 2015 දී 'මහින්ද සුළඟ' වේදිකාවට මා ගොඩ වූයේද මෙම දේශපාලන මණ්ඩලයේ අනුදැනුම ඇතිවය. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් වෙනම දේශපාලන පක්ෂයක් පිහිටුවිය යුතු යැයි මුලින්ම යෝජනා කළේ මමය. ඒ මිනුවන්ගොඩ මෙම දේශපාලන මණ්ඩලයේ අනුදැනුම ඇතිවය. 2018 පළාත් පාලන මැතිවරණයේදී වෙනම තරඟ කළ යුතු යැයි පක්ෂයට මා යෝජනා කළේද මෙම දේශපාලන මණ්ඩලයෙන් කළ මත විමසීමකින් පසුවය.

මෙම දේශපාලන මණ්ඩලය පක්ෂය වෙනුවෙන් හා අප වෙනුවෙන් කැප වූ සාමාජිකයන්ගෙන් සැදුම් ලද්දකි. මෙහි පළාත් පාලන නියෝජිතයන් මෙන්ම විවිධ වෘත්තිකයෝද සිටිති. මෙම ඡන්ද විමසීමේ එක් අරමුණක් වූයේ ගම්මට්ටමින් ජනතාව වර්තමාන දේශපාලනය පිළිබඳව දරණ මතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටයි.

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා රට තුළ මතුවූ අර්බුදකාරී අවස්ථාවේදී අගමැතිධුරය භාරගන්නා ලෙස විවිධ පාර්ශව වලට යෝජනා කර තිබුණද ඒ සියළු දෙනා ඊට එකඟතාවය පළ කළේ නැත. රනිල් වික්‍රමසිංහ වත්මන් ජනාධිපතිවරයා එම අභියෝගය භාරගත්තේය. පොහොට්ටුව ඒ සඳහා පූර්ණ සහාය පළ කළේ ඒ අනුවයි. රනිල් වික්‍රමසිංහ මහතා අගමැතිවරයා ලෙසත් ඉන් අනතුරුව ජනාධිපතිවරයා ලෙසත් පත්වූයේ මා දිස්ත්‍රික් නායකයා ලෙස කටයුතු කරන පොහොට්ටුවෙන් නැතහොත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නැමැති මගේ පක්ෂයේ සහායෙනි. නමුත් ඒ මොහොතේ අපි ඒ පිළිබඳ පාක්ෂිකයින්ගේ මත විමසීමක් කළේ නැත. ඊට හේතු වූයේ ඒ මොහොත වනවිට රට තුළ තිබූ තත්ත්වයයි. මේ නිසා එදා අප කළ දේ නිවැරදි දැයි මහජන මතය විමසීමේ අවශ්‍යතාවක්ද මට තිබිණ. මිනුවන්ගොඩ දේශපාලන මණ්ඩලයේ රහස් ඡන්දයක් පැවැත්වීමේ අනෙක් හේතුව එයයි. මෙම මත විමසීම කිසිසේත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැරයාමට කළ මත විමසුමක් නොවේ.

අද (24) උදෑසන දිවයිනට පැමිණීමෙන් පසු අදාල ඡන්ද ප්‍රතිඵලය මා වෙත ලැබී ඇති අතර මෙම දේශපාලන මණ්ඩලය සභිකයන්ගෙන් අතිබහුතරයක්ම පවසා ඇත්තේ මේ මොහොතේ වත්මන්

ජනාධිපතිවරයා සමඟ වැඩ කළ යුතු බවයි. ජනාධිපතිවරයාගේ කකුලෙන් නොඇද ඔහු ගෙන යන වැඩපිළිවෙලට සහාය පළ කළ යුතු බව ඔවුන්ගේ ස්ථාවරයයි.

අද අපේ රට පහු කරමින් සිටින්නේ රටට තීරණාත්මක කාලයකි. රටේ පවතින ආර්ථික හා සාමාජයීය අර්බුධයෙන් ගොඩ ගැනීම සඳහා අප කළ යුත්තේ පාරට බැස උද්ඝෝෂණය කිරීම හෝ ආණ්ඩුව පෙරලීමට කුමන්ත්‍රණය කිරීම නොවේ. අප කළ යුත්තේ පවතින තත්ත්වය තුළ රට ගොඩ ගැනීමට අපේ සහාය ලබා දීමය.

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාට මේ මොහොතේ සහාය දැක්වීම 'අලියාගේ පිටේ' නැගීමක් නොවේ. පොහොට්ටුව අතහැර යාමක්ද නොවේ. එය පොහොට්ටුවේ ජනමතය ආරක්ෂා කිරීම සඳහා මේ මොහොතේ ගත හැකි හා ගත යුතු හොඳම තීරණයයි. ඒ නිසා මිනුවන්ගොඩ දේශපාලන මණ්ඩලයේ මතයටද හිස නමමින් තවදුරටත් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාට පවතින අර්බුදයෙන් රට ගොඩ නැගීම සඳහා පූර්ණ සහාය පළ කිරීමට කටයුතු කරමි. ඒ වෙනුවෙන් ඕනෑම අභියෝගයක් භාර ගැනීමට සූදානම් බවද අවධාරනය කරමි.

රට වෙනුවෙන් හෘදය සාක්ෂියට එකඟව හැමවිටම නිවැරැදි දේශපාලන තීන්දු ගත් මම කිසි විටෙකත් මා පිළිබඳව විශ්වාසය තැබූ ගම්පහ මාගේ ජනතාව පාවා දීමට සූදානම් නැත. ඔවුන් මා කෙරෙහි තිබූ විශ්වාසය අබමල් රේණුවකින් හෝ බිඳ දැමීමටද සූදානම් නැත. කෙසේ වෙතත් ජනමතයට හිස නමමින් අවශ්‍ය මොහොතේදී නොපැකිලව අවශ්‍ය දේශපාලන තීන්දුව ගැනීමට මම සූදානම් බවද අවධාරණය කරමි. ඒ අන් කිසිවක් නිසා නොව සියල්ලට පෙර මාගේ රටත් ජනතාවත් මට වටිනා නිසාය.

ප්‍රසන්න රණතුංග
(නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය)